පෙර කලාපයෙන් →

1980 ජූලි වැඩ වර්ජනය සහ 2008 ජූලි වැඩ වර්ජනය අතර කිසියම් සමානකමක් ඇතැයි මට පෙනී යයි. ගුණාත්මක වශයෙන් ගත් කල මෙම වැඩ වර්ජන දෙකම අසාර්ථක විය. මෙවැනි වැඩ වර්ජන අසාර්ථක වන්නට බල පෑ විශේෂිත මෙන්ම පොදු කරුණු ගණනාවක් තිබුණේය.

1977 වකවාණුවේදී ජවිපෙ වෘත්තීය සමිති ව්‍යාපාරයේ සටන් පාඨ වූයේ 'එක් වැඩපොළක එක් වෘත්තීය සමිතියක්..', 'එක් වෘත්තීමය ක්ෂේත්‍රයකට පොදු වෘත්තීය සමිතියක්..' සහ 'ස්වාධීනවත්, ප්‍රජාතන්ත්‍රවාදී ලෙසත් ක්‍රියා කළ හැකි ජාතික වෘත්තීය සම්මේලනයක්' ගොඩ නගමු යන්නය. එහෙත් පසු කාලයක දී වෘත්තීය සමිති තුළ නොයෙක් ආකාරයෙන් උපක්‍රමික ලෙස කටයුතු කරන්නට යෑමේදී මෙම

ධනේෂ්වර ක්‍රමය තුළ මෙම තත්ත්වය උච්ච අවස්ථාවට පත් වී තිබෙනු දක්නට ඇත. අපේ රටේ මන්ත්‍රී පදවි දරන ඇතැම් අය මෙන්ම එක්සත් ජාතීන්ගේ සාමාජිකත්වය දරන ඇතැම් රටවල් ද ධනේශ්වර ක්‍රමය තුළ මෙසේ මිළයට ගත හැකි තත්වයේ වෙළෙඳ භාණ්ඩ බවට පත් වී තිබෙන බව දැකිය හැකිය. ජීවිතක්ෂයට පත් කරන ලද ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලෙයි මහතා ඉතාලියේදී ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ අන්දමට, 'මේක තමයි (ධනේශ්වර) ප්‍රජාතන්ත්‍රවාදය'; වෙනත් අන්දමකට කියනවා නම්, ධනේශ්වර ක්‍රමය තුළ තිබෙන ප්‍රධාන ලක්ෂණය නම් සියළු දේම විකුණා ගෙන කමින් ජීවත් වෙන්නට තිබෙන හැකියාවයි.



තේ දළු නෙළන කාන්තාවෝ

දීමට අදහස් කරන්නේ ජවිපෙ හි සිටි සහ සිටින සහෝදරියන් ගැන ඔහු උලුප්පා පෙන්වන ඕපා

# හද රිදවන මතක සුවඳ සහ අන්ධ භක්තිය - 4

සටන් පාඨ ගිලිහී ගොස් තිබිණි. වෘත්තීය සමිති ව්‍යාපාරයෙන් සාර්ථක ප්‍රතිඵල ලබන්නට නම්, අවස්ථාවාදී ලෙස එක් එක් දේශපාලන පක්ෂයක් වටා ගොනු වුණු වෘත්තීය සමිති ශක්තිමත් කිරීම වෙනුවට, 1977 වකවාණුවේදී ඉදිරිපත් කරන ලද මුල් සටන් පාඨ ඉහළින් ඔසවා තිබිය යුතුයයි සිතමි.

ගැහැණු පිළිබඳව රෝහිත සහෝදරයා කර තිබෙන "ගැඹුරු දේශපාලන විග්‍රහය" වෙත නැවතත් හැරෙමු.

ශ්‍රීමතී සහෝදරිය 'පරිවාර ළඳුන් අතර සිටි සිටු කුමරියක සේ කැපී පෙණුනාය' යනුවෙන් පවසන ඔහු 'ගැහැණු ස්වභාවයෙන් රන් අබරණ වලට ආශා ඇත්තෝ ය' යනුවෙන් ඊනියා දේශපාලන නිගමනයක් ද ඉදිරිපත් කර සිටියි. මෙය අද සිටින ජවිපෙ නායකයන් ඉදිරිපත් කරන නියාලු විග්‍රහයන්ට වඩා දෙවැනි වන්නේ නැත. ඊළඟට ඔහු කියා සිටින්නේ, ජනතා විමුක්ති පෙරමුණේ සහෝදරියන් 'එම ස්වභාවික ආශාව යටපත් කර ගෙන සිටින බවය'. අපේ රටේ කාන්තාවන් මුහුණ දී සිටින සැබෑ ප්‍රශ්න වලට ඔහු අවතීර්ණ වන්නේ නැත. ඔහු පවසන අන්දමට මෙම කාන්තා ස්වභාවය ධනේෂ්වර ක්‍රමයෙන් වියෝව පවතින නිරපේක්ෂ එකකි. සමාජවාදය ගනිකා වෘත්තියේ යොදා ගනිමින් ඇතැමුන්ට ධනේෂ්වර දේශපාලනය තුල ජීවත් විය හැකිව තිබෙන්නේත් මේ නිසාය.

ධනේෂ්වර ක්‍රමය තුළ හැම දෙයක්ම මිළයට ගත හැකි වෙළෙඳ භාණ්ඩයක් බවට පත් කර හෝ කරමින් ඇති බව අප කව්රුත් දන්නා කාරණයකි. කාන්තාවන් රන් අබරණ වලට ආශා වන්නේ ඔවුන්ගේ ස්වභාවයක් නිසාම නොව, සමාජමය පෙළඹවීම, අනුකරණය සහ කාන්තාවට සමාජයේ උරුම කොට දී තිබෙන තැන යනාදී හේතු ගණනාවක් නිසාය. මාතෘමූලික ඝන ගෝත්‍ර සමාජයට පසුව ඇති කරන ලද පීතෘමූලික සමාජය තුළ රජ කළේත්, රජ කරන්නේත් පුරුෂයාගෙ ආධිපත්‍යයයි. ඉන්දුනීසියාවේ බටහිර සුමාත්‍රාවේ තවමත් පවතින මීනන්කබෞ (Minangkabau) වැනි ගෝත්‍ර පදනම් වී තිබෙන්නේ මාතෘමූලික ක්‍රමය පාදක කොට ගෙනයි. එවැනි මාතෘමූලික සමාජයන් යටපත් කර දැමීමෙන් පසුව පීතෘමූලික සමාජ බිහි කර ගැනීමත් සමගයි, කාන්තාවන් තුළ මෙවැනි තත්ත්වයන් දෘෂ්‍යමාන වන්නට පටන් ගත්තේ.



සාරා සෙට්කින් සහ රෝසා ලක්සම්බර්ග්





බටහිර කාන්තා විමුක්ති ව්‍යාපාරය

**අපේ රටේ කාන්තාවන් මුහුණ දී සිටින සැබෑ ප්‍රශ්න වලට ඔහු අවතීර්ණ වන්නේ නැත. ඔහු පවසන අන්දමට මෙම කාන්තා ස්වභාවය ධනේෂ්වර ක්‍රමයෙන් වියෝව පවතින නිරපේක්ෂ එකකි. සමාජවාදය ගනිකා වෘත්තියේ යොදා ගනිමින් ඇතැමුන්ට ධනේෂ්වර දේශපාලනය තුල ජීවත් විය හැකිව තිබෙන්නේත් මේ නිසාය.**

ධනේශ්වර පාරිභෝගිකවාදයේ ලක්ෂණයන් වන්නේ, වෙළෙඳ භාණ්ඩ අධි නිෂ්පාදනය කිරීමත්, මුදල් කර ගැනීමට එම භාණ්ඩ පාරිභෝගිකයා අතට පත් කිරීම සඳහා ධනේශ්වර ව්‍යාපාරයන් අතර ඇති වන තරගයත් ය. විවාහ යෝජනාත්, ඒ සඳහා පෙර සූදානම් වීමත්, විවාහයත් අද කාලයේ රැඳී තිබෙන්නේ කාන්තාවන් වෙළෙඳ භාණ්ඩ බවට පත් කර තිබෙන සමාජයකය යන්න අමතක කරන්නේ හෝ එසේ කළ හැකි වන්නේ මොන සමාජ වාදියාටද? මේ නිසා, 'ගැහැණු ස්වභාවයෙන් රන් අබරණ වලට ආශා ඇත්තෝය..' යන ප්‍රකාශයෙන් කරන්නේ සමාජයේ පවතින විෂය මූලික කාරණා අමතක කරන්නට සලස්වා, සැබෑ කරුණු විකෘති කොට, ඒ වෙනුවට ඕප දූප ගැන පමණක් කතා කරන්නට සැලැස්වීමයි.

ඉහත සඳහන් කරුණු වලින් මා පෙන්වා

දූප සහ විකෘති කිරීම් වලට වඩා, අමතර ලෙස බලපා තිබුණු සැබෑ කරුණු පැවතුන බව ය.

ඇත්ත තත්වය නම් ජනතා විමුක්ති පෙරමුණේ අර්ධකාලීනව හෝ පූර්ණකාලීනව වැඩ කටයුතු කළ සහෝදරියන් බොහෝ දෙනෙක්ම පාරිභෝගිකවාදයට ගොදුරු නොවී සිටිය බවයි. ඔවුන් ලබා තිබුණ දේශපාලන අවබෝධය අනුව එවැනි දේවල් වල යෙදීමේ නිරර්ථක භාවය ඔවුන් තේරුම් ගෙන සිටින්නට ඇති බවයි. (ස්වර්ණ) අබරණ වැනි දේ පෞද්ගලිකව අත්පත් කර ගැනීමට තරම් වූ ආර්ථික තත්ත්වයක් ඔවුන් බොහෝ දෙනෙකුට ඇතැම් විට නොතිබෙන්නට ඇති බවයි.

එම කරුණු කෙසේ වෙතත්, සැබෑ ලෙසම කණගාටු විය යුතු කාරණය වන්නේ සමාජවාදී යයි කියා ගන්නා අයගේ පවුල් වල පවා, කාන්තා පාර්ශ්වයට වෙනස්කම් කිරීම තවමත් පවත්වා ගෙන යනු දකින්නට ලැබීමයි. සමාජවාදය ගැන දේශනා කරමින්, තම පවුල් තුළ පවා පුරුෂ ආධිපත්‍යය තර්ජනාත්මක ලෙස පවත්වා ගෙන යෑම නරුම සමාජවාදයක් නොවේද?

ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධව සිට පසුව එයින් ඉවත් කරන ලද සහ ඉවත් වූ අය ගැන රෝහිත මුණසිංහ සහෝදරයා විසින් ඕප දූප කිහිපයක් මත පදනම් වෙමින් ප්‍රබන්ධ කොට ඉදිරිපත් කොට තිබෙන කරුණු කිහිපයක් ගැන මී ළඟ ලිපියෙන් සාකච්ඡා කරමු.

ලයනල් බෝපගේ



නමෝතස්ස භගවතො
අරහතො සම්මා
සම්බුද්ධස්ස

*භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා!!*

මිනිස් වර්ගයා පමණක් නොවෙයි මුළු මහත් ජීව ලෝකයම අන්‍යෝන්‍ය සාපේක්ෂතාවකින් එහෙමත් නැත්නම් එකිනෙකා හා එකිනෙක අතර මනා සහ සම්බන්ධයකින් බැඳී සිටිනවා. ඒ අතර මිනිසාට පමණක් සුවිශේෂී වූ සක්‍යතාවක් තමයි "කතාබහ". නමුත් අවාසනාවකට වගේ මේ සුවිශේෂී හැකියාව නිවැරදි ලෙස භාවිතයේ යොදවන්නට අසමත් වෙන අවස්ථා බොහොමයි. ඒ නිසාම අපි අතර මිතුරුකම් වලට වඩා සතුරුකම් ඇති වෙලා තිබෙනවා. සමගිය, සමාදානය වෙනුවට අසමගිය, අහිතවත්කම, එකිනෙකා නුරුස්සන ගතිය ඇති වී තිබෙනවා.

කතාබහේදී වචනයේ සුහද බව ආරක්ෂා වීමට මුහුණේ ඉරියව් ද, හඬෙහි ස්වරූපය ද ප්‍රබල බලපෑමක් ඇති කරනවා. ප්‍රසන්න ඉරියව්වක් මුහුණේ ඇති වන විට කතාවේද ප්‍රසන්න බවක් නිරායාසයෙන් ඇති වෙනවා. ඒ නිසා කෙනෙක් හා කතාබහේදී මේ පිළිබඳව වැඩි සැළකිල්ලක් දැක්විය යුතුයි.

සමාජගත ජීවිතයේදී අසාර්ථක ලෙස ඔවුනොවුන් හා සම්බන්ධ වන්නේ කෙසේද යන පැණයට ඉතා වැදගත් පිළිතුරක් "කරණීය මෙත්ත" සූත්‍රයේ ඉදිරිපත් කොට තිබෙනවා. එනම් පහසුවෙන් කතා කළ හැකි පුද්ගලයෙකු බවට පත් විය යුතු බවයි. මින් අදහස් කරන්නේ කුමක්ද? කතා කිරීමට පහසු පුද්ගලයා ලෙස එහි පැහැදිලි කරන්නේ තමාගේ අදහසේ පමණක් දැඩිව පිහිටා නොසිට අන් අයගේද අදහස් පිළිගැනීමට කැමති පුද්ගලයායි. තමන් ගත් මතය නිවැරදි නොවන බව දැන දැනම කෙස් පැලෙන තර්ක ඉදිරිපත් කරන සමහරෙකු ගැන ඔබ අත්දැක ඇතිවාට සැකයක් නැහැ. එවන් අය හිතන්නේ අන් අයගේ මතයක් පිළිගැනීමට සිදුවීම මදි පුංචිකමක් ලෙසයි. සැබවින්ම එය මානසික රෝගයක්. හීනමානය යනුවෙන් බුදුසමය හඳුන්වන්නේ එයයි.

බුදුසව්වන් අතර ප්‍රඥාවෙන් අගතැන්පත් අග්‍රශ්‍රාවක සැරියුත් මහ රහතන් වහන්සේ දිනක් සක්මනේ යෙදෙන කොට උන්වහන්සේගෙ සිවුරු කොණක් බිම ගෑවෙනවා දැකපු පුංචි රාහුල හාමුදුරුවො සැරියුත් මහ රහතන් වහන්සේට ඒ කාරණය පෙන්නල දුන්නම සාදු නාද පවත්වල උන්වහන්සේ ඒ කාරණය පිළිගත්තා. ඒ විතරක් නෙමෙයි, රාහුල හිමියන්ට ප්‍රශංසාවකුත් කළා.

වරදක් දුටු විට එය කරුණාවෙන් පෙන්වා දීමත්, වරද පෙන්වා දුන් පුද්ගලයගේ තරාතිරම ගැන කල්පනා නොකොට වරද වරදක් හැටියට දැකලා, ඒ ගැන තම කණගාටුව පළ කොට වරද නිවැරදි කර ගැනීමත් උසස් ආර්යය ගුණයක්. සමහර තැනකදී සමහරෙක්, කෙනෙක්ගෙ අඩුපාඩුවක්, වරදක් දැක දැකත් එම පුද්ගලයා තමන් සමඟ අමනාප වේ යැයි සිතා එකී වරද ගැන කතා නොකොට සිටිනවා. සැබවින්ම එවන් මොහොතක ඔහු කරන්නේ බලවත් හානියක්. එවන් අය බුදුසමය හඳුන්වා තියෙන්නේ ඇසුරු නොකළ යුතු "අපාය සහාය" පාප මිත්‍රයන් හැටියටයි.

යහපත් කතාබහ ඔබේ දිවියට ආශීර්වාදයක් වේවා!!

ඔබ සැමට සම්මා සම්බුදු සරණයි!!

**ශාස්ත්‍රපති පූජ්‍ය රත්මලේ පුඤ්ඤදරතන හිමි ජර්මනිය**

*www.karuna-samadhi.de*